## කටුනායක-සීදුව නගර සභාව

## ගම්පහ දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 29 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 16 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, කටුනායක - සීදුව නගර සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර, 2010 දෙසැම්බර් 31 දිනට කටුනායක - සීදුව නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ වරිපනම් සඳහා ලබාදී තිබූ වට්ටම් රු.99,089 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සේවක ඇප රු.2,851 ක් නිදහස් කර තිබුණද,සේවක ඇප හා සේවක ඇප ආයෝජන ගිණුම් වලට ගලපා නොතිබුණි.

(ඇ) ස්ථාවර තැන්පත් රු.5,225,000 ක් ලෙස ගිණුම් ගතකර තිබුණද සීදුව මහජන බැංකුවේ 1000015794 අංක දරණ ස්ථාවර තැන්පතුවේ 2010 දෙසැම්බර් 31

---

දිනට වූ බැංකු සනාථ ලිපිය අනුව එදිනට තැන්පත් ශේෂයෙහි සඳහන් මුළු පොලි මුදල වූ රු.275,972 ක මුදල ආයෝජන ගිණුමට හරකල යුතු වුවද, ලැබිය යුතු වෙනත් ආදායම් ගිණුමට හරකිරීම නිසා ආයෝජන ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2008 හා ඉකුත් වර්ෂ වෙනුවෙන් එකතු කළ අගය මත බදු ගිණුමේ ආරම්භක ශේෂය ලෙස රු.680,705 ක බැර ශේෂයක් ලෙස දක්වා තිබුණද, නිමවුම් බද්ද අඩුවෙන් ගණනය කිරීම, නිවැරදි කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.685,112 ක් ගෙවා තිබුණෙන් ශේෂය හර ශේෂයක් බවට පත්වී තිබුණි. තවද 2011 වර්ෂයේදී 2008 ට පෙර වර්ෂ වෙනුවෙන් රු.70,878 ක් ගෙවා තිබුණද, එය සමාලෝචිත වර්ෂයේ ණය හිමියන් සේ පෙන්වා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී යෙදවුම් බද්දෙන් හිලව් කිරීම සඳහා ඉඩදියහැකි යෙදවුම් බදු ප්‍රමාණය රු.1,321,139 ක් වුවද, ජර්නල් සටහන් 39 මගින් රු.1,319,378 ක් ගිණුම් ගතකර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ එකතු කල අගය මත බදු වාර්තා සකස් කිරීමේදී නිමවුම් බද්ද රු.1,851,921 ක් ලෙස දක්වා තිබුණද, ගිණුම අනුව රු.1,855,579 ක් වූයෙන් රු.3,658 ක් අඩුවෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර තිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයකට අදාල පාලන ගිණුම් අනුව ශේෂය රු. 8,752,049ක වූ අතර, උපයෝගී ලේඛණය අනුව ශේෂය රු.8,863,542.ක් විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2011 ජුනි 30 දින වන විට විගණන විමසුම් 16 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.63,342,223 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

ගිණුම් විෂයයන් 10 කට අදාළ අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකරීම නිසා එකතුව රු..265,019,817 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| <u>නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| (අ) පළාත් පාලන කොමසාරිස්ගේ 1988 අප්‍රේල් 20 දිනැති අංක.88/20 දරන චක්‍රලේඛය. | අයවීමට ඇති හිඟ හිටි වෙනත් ආදායම් පිළිබඳ කාල ප්‍රකාශයක් සකස් කර නොතිබුණි. |
| (ආ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද පළාත් පාලන ආයතනවලට බලතල පවරා දීම හා බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් | ස්ථාන පරීක්ෂණ කටයුතු සහ පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු සඳහා ලැබෙන ආදායම, පළාත් පාලන ආයතනයේ වෙනම අය ශීර්ෂයක් යටතේ පවත්වා නොතිබුණි. |

---

**මාලාවේ පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාපටිපාටියේ උපලේඛණ 02 හි අංක 09 වගන්තිය (i).**

**1.3.5 නිරවුල් නොවූ ගිණුම්**

**අවුරුදු 05 කට අධික කාලයක් තුල බැංකු සැසඳුම්වල ඉදිරියට ගෙන එමින් තිබෙන ස්ථාවර තැන්පත් පොලී හා අගරු වූ චෙක්පත් පිළිවෙලින් රු.12,900 ක් හා රු.2,500 ද, 2007 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් තිබෙන අගරු චෙක්පත් රු.61,870 ක් ද නිරවල් කරීමට හෝ ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.**

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 32,188,247 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 48,341,830 ක් විය.**

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

**ඇස්තමේන්තුගත, තථ්‍ය හා හිඟ ආදායම් පිළිබඳ විස්තර ඉදිරිපත් කරන ලෙස මවිසින් 2011 මාර්තු 08 දින සභාපතිවරයාගෙන් ඉල්ලීම් කර හා සිහිකැඳවීම් කර තිබුණ ද, 2011 දෙසැම්බර් 31 දින දක්වා අදාල විස්තර ඉදිරිපත් කර නොතිබුණි.**

**2.2.2 සීදූව නව වෙළඳ සංකීර්ණයේ කඩකාමර බදුදීම**

(i) වෙළඳ සංකීර්ණයේ කඩකාමර 59 කින්, කඩ කාමර 30 ක් පමණක් 2010 දෙසැම්බර් 31 දින දක්වා බදුදී තිබූ තිබුණි. බදුකරුවන් ඉදිරිපත් නොවීම නිසා කඩකාමර 29 ක් බදුදීමට කටයුතු කර නොතිබුණි.

(ii) වෙළඳ සංකීර්ණය මුල් සැලැස්මට අමතරව ඉදිකර තිබූ කඩ කාමර 14 කින් සමන්විත දෙමහල් වෙළඳ සංකීර්ණය ප්‍රධාන මාර්ගයට මුහුණලා පිහිටා නොතිබීම නිසා, මේ වනවිට එකම කඩ කාමරයක්වත් ටෙන්ඩර් වී නොතිබුණි. එකී ඉදිකිරීම කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් කර නොතිබුණ අතර, මෙම කඩකාමර ඉදිකිරීමට පෙර ටෙන්ඩර් කර විකිණීමට හෝ සළකා බලා නොතිබුණි.

(iii) රුපියල් ලක්ෂ 425 ක පමණ වියදමකින් ඉදිකර තිබූ වෙළඳ සංකීර්ණයෙන් ස.තො.ස. ආයතනයට බදුදුන් කඩකාමර 05 න් ලැබෙන රු.34,387 ඇතුලත්ව මාසික කඩ කුලිය වශයෙන් රු.79,737 ක් පමණක් ලැබී තිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | 000' | 000' | 000' | 000' | 000' | 000' |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 43,985 | 40,886 | 3,099 | 37,988 | 37,620 | 368 |
| අනෙකුත් | 55,954 | 47,455 | 8,499 | 44,591 | 53,092 | (8,501) |
| උප එකතුව | 99,939 | 88,341 | 11,598 | 82,579 | 90,712 | (8,133) |
| ප්‍රාග්ධන වියදම | 85,460 | 102,957 | (17,497) | 141,666 | 109,334 | 32,332 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **මුළු එකතුව** | 185,399 | 191,298 | (5,899) | 224,245 | 200,046 | 24,199 |
| | ============ | ============ | =========== | ============ | ========== | =========== |

**2.4 මානව සම්පත් කළමනාකරණය**

**2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු 2011 මාර්තු 08 දින මවිසින් ඉල්ලීම් කර හා සිහිකැදවීම් කර තිබුණ ද එකී තොරතුරු 2011 දෙසැම්බර් 31 දින දක්වා ඉදිරිපත් නොවිය.

**2.4.2 ව්‍යාපෘති සේවකයින් බඳවා ගැනීම**

(i) මාර්ග හා සෞඛ්‍ය කම්කරු පුරප්පාඩු 08 ක් සම්පුර්ණ කර නොතිබුණි. වෙනත් විවිධ ව්‍යාපෘති සඳහා කම්කරුවන් 107 දෙනෙකු 2010 මැයි 31 දින සභා අනුමැතියෙන් බඳවාගෙන තිබුණද, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ඉහත පරිදි අනුමැතියකින් තොරව බඳවාගෙන තිබූ කම්කරුවන්ට 2010 ජුනි මාසය වනවිට රු.1,369,750 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණද, එක් එක් ව්‍යාපෘතියට අදාල වැඩසටහන, අරමුණ, අපේක්ෂිත කාර්යය ඇතුලත් ලිපිගොනුව, ව්‍යාපෘති වාර්තාව, පසු පරීක්ෂණ වාර්තා, ප්‍රගති සමාලෝචන වාර්තා සහ සේවකයන්ගේ බඳවා ගැනීම් පරිපාටි ආදිය විගණනයට ඉදිරිපත නොකරන ලදී..

**2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**(අ) ගබඩා පාලනය**

(i) විදුලි අංශයේ තොග ලේඛණයට අනුව අවස්ථා 12 කදී තොග ශේෂ නොමැතිව තොග නිකුත් කිරීම් කර තිබූ අතර, තොග ලේඛණයේ දැක්වෙන විෂයන් 03 ක තොග 2011 පෙබරවාරි 02 දින භෞතිකව පරීක්ෂා කිරීමේදී තොග ඌණතා නිරීක්ෂණය විය.

(ii) තොග ලෙජරය හා තොග ලේඛණය (බින්කාඩ්) පවතවා ගැනීම නිලධාරීන් දෙදෙනෙකු විසින් කරනු වෙනුවට, සියලු කටයුතු ගබඩා භාරකරු විසින්ම කර තිබුණි. මේ අනුව ගබඩා පාලනය පිළිබඳව ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය.

(iii) පවත්වා තිබූ තොග ලෙජරයේ 2010 අගෝස්තු 30 දිනෙන් පසු නිකුත් කිරීම් සටහන් කර නොතිබූ අතර, භාණ්ඩ ලැබීම් පත්‍රිකා අංක සඳහන් නොකිරීම, භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් වලින් පසු තුලනය නොකිරීම හා වගකිවයුතු නිලධාරියෙකුගේ පරීක්ෂා කිරීම් අත්සන් මගන් තහවුරු කර නොතිබුණි.

(iv) තොග ඇණවුම් ක්‍රියාවලියේදී තොග ලෙජරය පාලන උපකාරයක් ලෙස යොදා නොගැනීම නිසා 2011 පෙබරවාරි 02 දිනට බල්බ් 140 ක අධික තොග ශේෂයක් නිරීක්ෂණය විය.

(ආ) ජලනල එළීමේ කර්මාන්තය

-------------------------------

(i) ප්‍රසම්පාදන කමිටුව සඳහා නගර සභා මන්ත්‍රීවරු පමණක් පත්ව තිබූ අතර, ටෙන්ඩර් විවෘත කිරීම හා පිළිගැනීම නගර සභා නියෝජිතයන් ඉදිරියේ පමණක් සිදුකර තිබුණි.

(ii) ව්‍යාපෘතිය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබූ ද්‍රව්‍ය පිළිබඳ ලිඛිත තහවුරුවක් ඉදිරිපත් කිරීමට සභාව අපොහොසත්වූ අතර, සකස්කර තිබූ අවශ්‍යතා ඇස්තමේන්තු තුළ එම ප්‍රමාණයන් ඇතුලත් වී ඇත්ද යන්න විගණනයට තහවුරු නොවීය.

(ඇ) අංක:49-7632 දරණ ට්‍රැක්ටරයේ අලුත්වැඩියාව

----------------------------------------------------

**ඉහත අංක දරණ ට්‍රැක්ටරය අළුත්වැඩියාව සඳහා වැඩ අධිකාරීගේ නිර්දේශ රහිතව ගරාජයකට භාරදී අලුත්වැඩියා නොකර අවුරුදු 03 කට අධික කාලයකට පසු නැවත සභාව වෙත 2011 අප්‍රේල් 19 දින ආපසු රැගෙන විත් තිබුණද, 2011 නොවැම්බර් 24 දින වන විටත් අලුත්වැඩියාවකින් තොරව ගාල්කර තිබුණි.**

**2.6 අභ්‍යන්තර විගණනය**

--------------

**ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.**

**3. පද්ධති හා පාලන**

------------

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමුකෙරේ.**

**(අ) ගිණුම්කරණය**

**(ආ) ආදායම් පරිපාලනය**

**(ඇ) අභ්‍යන්තර විගණනය**

**(ඈ) වාහන පාලනය**

**(ඉ) මානව සම්පත් කළමනාකරණය**